# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 ජනවාරි / පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH E2015**

**සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමා**

**එක් කොටසකින් එක් ප්‍රශ්නයක් බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

**නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

**1 කොටස**

01. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා කතුවරයාගේ අවස්ථා නිරූපණ කුසලතාව අගයන්න.

> ආළවක තෙමෙ එ හඬ ගසා 'මෙ විටැ මෙ මහණු පුලුන්පෙදක් සෙ පරසක්වළැ ගසාපියමි' මහාවාතයක් මැවී යැ. එ වාතය හැමූ කලැ ලොකයෙහි ගලෙකින් ඊ ඊ නො ගැසුණු ගලෙක් නැත, දෙ යොදුන් තුන් යොදුන් පමණ මහ ගල් කුළු කැඩී පැළී දෙ කඩ වැ හෙන්නට වන, අහසට නැඟී ඊ ඊ ගැසී දුම්කඳ නැඟෙන ගල්කුළු ගණන් නැත, මහ වලැ ගස් මුලින් ඉදිරීගොස් අහසැ නො නැටු ගසෙක් නැත, නො එක් ඇත්හල්හි පල තාක් තනකුළු පිටින් මැ අහසට නැඟී බමමින් සිටියෙ යැ, නො එක් ගැල්සක් තාක් පරඬලා සෙ අහසට නැඟී සිසැරෙන්නට වන, පොළොවින් නැඟි ධූලි අහස්හි මහ පොළොව බඳනා සෙ හැසී ගැවැසී නැඟෙන්නට වන, සර්වඥයන් වහන්සෙ වැන්නන් 'පරසක්වළ ගසාපියමී' මැවු පවන මහත කවරෙක් නම් කියා නිමවා ද? එ මහා වාතය එසෙ භයානක වැ හමන්නට වනැ. සර්වඥයන් වහන්සෙ 'මෙ මහා වාතයෙන් පණුවකු පමණ සතකුටත් උපද්‍රවයෙක් නො වේව'යි අධිෂ්ඨාන කොටැ - වදාළ සෙයෙකැ. එසෙ හෙයින් පණුවකුටත් උපද්‍රවයෙක් නො වී යැ. අනුනට මෙසෙ උපද්‍රව නැති කරන එ බුදුරජාණනට උපද්‍රව නො වන බව කවර විස්මයෙක් ද? එ වාතය එසෙ හැමූ සමයයෙහි මඳ පවනට මහ මෙර නො සෙල්වෙන්නා සෙ එ සර්වඥයන් වහන්සෙ ගෙ ශ්‍රී ශරීරයෙහි රොමකූප මාත්‍රයෙකුදු නො සෙල්විණැ.

02. පොළොන්නරු දඹදෙණි යුගවලට අයත් සිංහල ගද්‍ය සාහිත්‍යයෙන් පිළිබිඹු වන සාරධර්ම පිළිබඳ විස්තරයක් කරන්න.

03. බුත්සරණ කතුවරයා විසින් උපයුක්ත ධර්මදේශනා රීතිය අභිප්‍රේතාර්ථ සාධනයෙහි ලා කෙතෙක් දුරට උපස්ථම්භක වී ඇත්දැයි විමසන්න.

**නැතහොත්**

'උපමා සහ ප්‍රස්තාව පිරුළු මිශ්‍ර කරගනිමින් කථා පුවත් රසවත් ව ඉදිරිපත් කිරීම ධර්මසේන හිමියන්ගේ කථා කලාවේ කැපී පෙනෙන ලක්ෂණයකි.' සාකච්ඡා කරන්න.

## 2 කොටස

04. 'සම්භාව්‍ය සිංහල කථා කලාවේ නිර්මාණාත්මක ලක්ෂණ නූතන ප්‍රබන්ධ කථාවන්හි ද මැනවින් ප්‍රකට වෙයි.' මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව පහදන්න.

05. 'බෞද්ධාගම පරිහානියට පත් වීම කෙරෙහි යටත් විජිත පරිපාලනය ද වගකිව යුතු ය.' මේ ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහි ද?

06. විලාසිනියකගේ ප්‍රේමය වූ කලි අපේක්ෂා භංගත්වයට පැමිණි සාමාවගේ ශෝකාන්තයයි.' කණවේර ජාතකය සමඟ සසඳමින් මේ ප්‍රකාශයෙහි යුක්ති යුක්ත භාවය පහදන්න.

නැතහොත්

කාලීන සමාජ යථාර්ථය ග්‍රහණයෙහි ලා මධුරසිංහ ගුණතිලක දැක්වූ සාමර්ථ්‍යය තාපපටලය කෙටිකථා සංග්‍රහය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

## 3 කොටස

07. කෝලම් නාටකයේ ප්‍රභවය අරභයා වූ මතවාද සමාලෝචනය කරන්න.

08. 'සිංහබාහු නාටකයෙන් සංකේතවත් වන්නේ පරම්පරා ගැටුම ය.' ඔබේ අදහස් දක්වන්න.

09. 'බලය අතට ගත්විට තම මිතුරන් දෙස සැකයෙන් ම බැලීම හැම දුර්දාන්ත පාලකයකු ම පෙලන රෝගයකි.' ප්‍රොමිතියස්ගේ මේ ප්‍රකාශය තත් චරිතය ආශ්‍රයෙන් නිරූපණය වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

10. 'අනෙකුත් කලාංගයන් සමඟ සැසඳීමේ දී චිත්‍රපටය වඩාත් සමීප වන්නේ නවකථාවට ය.' මේ ප්‍රකාශය තහවුරු කරන්න.

***********************